කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී පළමු වසර අවසාන පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය, 2016/2017

**INR 1204: ජාත්‍යන්තර සබඳතාවන් හි භාවිතය**

කාලය: **පැය දෙකයි (02)**

ප්‍රශ්න **හතරකට (04)** පමණක් පිළිතුරු සපයන්න.

---

1. කොටස් **දෙකටම (02)** පිළිතුරු ලියන්න.

   i. තුෂ්ණි යුද්ධය බිහිවීමට තුඩු දුන් ප්‍රධාන සිද්ධි සැකවින් විස්තර කරන්න. (ලකුණු 15)

   ii. 1945-1970 දක්වා කාලය තුළ සුපිරි බලවතුන් අතර පැවති අරගලයෙහි ප්‍රධාන ලක්ෂණ මොනවාද? (ලකුණු 10)

2. කොටස් **සියල්ලටම** පිළිතුරු ලියන්න.

   i. නොබැඳි ව්‍යාපාරයේ අරමුණු නම් කරන්න (Non Alignment Movement). (ලකුණු 5)

   ii. තුෂ්ණි යුද කාලය තුළ නොබැඳි ව්‍යාපාර සිදුකරන ලද වැදගත් කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 10)

   iii. සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව (Union of Soviet Socialist Republics) බිඳ වැටීමෙන් පසු නොබැඳි ව්‍යාපාරයේ අදාළත්වය පහදන්න. (ලකුණු 10)

3. **එක්කෝ**

   අ. පහත අනු තේමා කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් මහජන චීන සමූහාණ්ඩුව පිළිබඳ රචනාවක් ලියන්න.

   i. චීනයේ සංස්කෘතික විප්ලවය (Chinese Cultural Revolution) (ලකුණු 8)

   ii. චීන ලක්ෂණ සහිත සමාජවාදය (Socialism with Chinese characteristics) (ලකුණු 8)

   iii. ෂි ජින්පින්ග් ගේ චීනයේ සිහිනය (Xi jinping's Chinese dream) (ලකුණු 9)

   **නැතහොත්**

   ආ. පහත අනු තේමා කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් ජපානය පිළිබඳ රචනාවක් ලියන්න.

   i. ජෙනරාල් ඩග්ලස් ඒ මැක්ආතර් යටතේ (General Douglas A. MacArthur) අත්පත්කරගැනීම (Occupation) හා ජපානයේ ප්‍රතිසංස්කරණය (Reconstruction) (ලකුණු 8)

ii. යොෂිඩා ධර්මතාවය (Yoshida Doctrine) (ලකුණු 8)

iii. අබේ ධර්මතාවය (Abe Doctrine) හා ගෝලීය පාලනය (global governance) (ලකුණු 9)

4. කොටස් **<u>දෙකටම (02)</u>** පිළිතුරු ලියන්න.

   i. "නිර්යටත්විජිතකරණය" (Decolonization) නිර්වචනය කරන්න. (ලකුණු 5)

   ii. "අනන්‍යතාවය හා අරමුණු සඳහා අරගල කිරීම නිර්යටත්විජිතකරණය නම් වේ". සුදුසු ක්ෂේත්‍ර අධ්‍යනයක් ඇසුරෙන් මෙම කියමන පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 20)

5. "ජාත්‍යන්තර සමාජය" (International Society) ස්ථාපිත කිරීමෙහිලා රාජ්‍ය නොවන පාත්‍රයන්ගේ දායකත්වය පැහැදැලි කරන්න. (ලකුණු 25)

6. පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNO) විශ්ලේෂණය කරන්න.

   i. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන අරමුණු (ලකුණු 5)

   ii. තිරසාර සංවර්ධන අරමුණු (Sustainable Development Goals: SDG) (ලකුණු 10)

   iii. 21 වන සියවස තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කාර්යභාරය (ලකුණු 10)

7. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම **<u>දෙකක් (02)</u>** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න. (ලකුණු 12.5 x 2)

   i. යකඩ තිරය (Iron curtain)

   ii. සංහිඳියාව (Detente)

   iii. සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව බිඳ වැටීම (The collapse of USSR)

   iv. ගෝලීයකරණයේ ආකාර (Types of globalization)

   v. අරාබි වසන්තය (Arab Spring)

*************************